# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2447/18 – 2025 ජූලි මස 29 වැනි අඟහරුවාදා – 2025.07.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 73 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/96/FR/480.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/MDB/4/2/1/71/08.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 ජූලි මස 23 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මැදදුම්බර.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩසියපත්තුව දකුණ කෝරළේ සුළු කොට්ඨාසයේ, මාංගොඩ ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි. මහ 5761 හා 2008.03.26 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබැලිවලට මායිම්:

01. කැබලි අංක 1 - බෝගහමුල හේන - ප්‍රමාණය: හෙක්. **0.3246**

උතුරට: මු.පි. A 253හි කැබලි අංක 10, නාදුනනහින්න හේන (හි.පි. 53963) සහ මු.පි. A 253 හි කැබලි අංක 6; නැගෙනහිරට: මු. පි. A 253හි කැබලි අංක 6, 7 සහ ජේ. එම්. අබේරත්නට අයත් ගලඅස්සේ හේන; දකුණට: ජේ. එම්. අබේරත්නට අයත් ගලඅස්සේ හේන, මු.පි. A 253 හි කැබලි අංක 8, 6 සහ මු.පි. මහ 5585 හි කැබලි අංක 1; බටහිරට: මු. පි. A 253 හි කැබලි අංක 10 .

02. කැබලි අංක 2 - බෝගහමුල හේන - ප්‍රමාණය: හෙක්. **0.0327**

උතුරට: මු.පි. A 253හි කැබලි අංක 10 සහ 8; නැගෙනහිරට: මු. පි. A 253හි කැබලි අංක 8 සහ ජේ. එම්. අබේරත්නට අයත්

වඩුවාවල කුඹුරේ වනාත; දකුණට: ජේ. එම්. අබේරත්නට අයත් වඩුවාවල කුඹුරේ වනාත; බටහිරට: මු. පි. A 253 හි කැබලි අංක 10 .

EOG 07 – 0343

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2025 අංක 75 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/16/2019/UDA/251.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මහ/ඉ/අත්/377.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මහරගම.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 493 කළල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කළල්ගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක CO/MHR/2018/774 හා 2018.12.20 දිනැති පූගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 - ඉඟුරුවත්ත දෙනිය - ප්‍රමාණය: හෙක්. 1.0066**

උතුරට: ඇළ සහ කාවින්ද රජිත මෛත්‍රී හිමිකම් කියන වරිපනම් අංක 65/66, කළල්ගොඩ පාර; නැගෙනහිරට: නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ජින්ජර්හේනවත්ත, ඇළ සහ ආර්. රන්ජනී හිමිකම් කියන මිල්ලගහවත්ත; දකුණට: පාර, ලලිත් චන්ද්‍රරත්න හිමිකම් කියන මිල්ලගහවත්ත සහ ජයගත් මාවත; බටහිරට: ඇළ .

EOG 07 – 0344

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.